**කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2021**

කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස්දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ දිස්ත්‍රික්කයේ කොහුවල සහ මහනුවර දිස්ත්‍රික්කයේ ගැටඹේ ස්ථානගත කිරීමට සැලසුම් කර ඇති ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කොහුවල ගුවන් පාලම සහ ගැටඹේ ගුවන් පාලම යන ස්ථාන 02ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු. මිලියන 11,167 කට සමාන යූරෝ මිලියන 54.97 ක් වන අතර ඉන් රු. මිලියන 10,192 කට සමාන යූරෝ මිලියන 52ක් සැපයීමට හංගේරියානු ආනයන - අපනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු. මිලියන 975 ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 අගෝස්තු 16 දින ආරම්භ කරන ලද අතර, 2024 පෙබරවාරි 15 දින වන විට අවසන් කිරීමට නියමිතය.

**1.3 තත්වාගණනය කළ මතය.**

මගේ මතය අනුව, මගේ වාර්තාවේ 2 වගුවේ විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම.**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන ගැටළුව | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු පොලිය සඳහා වන වෙන්කිරීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | 23 | එකඟ වේ. ඒ අනුව පොලී ප්‍රතිපාදන ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වූ පොලිය නිවැරදිව වෙන්කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 05 ට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද විනිමය ගැලපුම් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | 95.43 | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 අනුව විනිමය ගැලපුම් කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

ගැටඹේ ගුවන් පාලමේ සහ කොහුවල ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු 2021 අගෝස්තු 16 වන දින ආරම්භ කර ඇති අතර පිළිවෙලින් 2024 පෙබරවාරි 15 සහ 2023 ජුනි 16 දින අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ මාසික වියදම් වාර්තාවට අනුව විදේශ ණය ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 1,633ක් හෙවත් සියයට 38ක් සහ රජයේ අරමුදල් ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 115ක් හෙවත් සියයට 24ක් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් භාවිත කර නොමැත.